**11**
**පාඩම**
एकादशः पाठः

# තෘතීයා ප්‍රයෝග

## තෘතීයා විභක්ති ප්‍රයෝග

| | | |
|---|---|---|
| हस्त = අත | हस्तेन = | අතින්/<br>අතේ උපකාරයෙන්/<br>අතේ උදව්වෙන්/<br>අත කරණ කොටගෙන |

උදා:

| | | |
|---|---|---|
| अहं हस्तेन लिखामि। | - | මම අතින් ලියමි. |
| अम्बा अग्निना ओदनं पचति। | - | අම්මා ගින්නෙන් බත පිසයි. |
| सुमेधः नेत्राभ्यां पश्यति। | - | සුමේධ දෑසින් බලයි. |

| | | |
|---|---|---|
| अनुज = මල්ලී | अनुजेन सह<br>अनुजेन सार्धम् | } මල්ලි සමග |

උදා:

अग्रजः अनुजेन सह क्रीडति।
අයියා මල්ලී සමග සෙල්ලම් කරයි.

आचार्यः शिष्येन सार्धं पाठालयं गच्छति।
ගුරුවරයා ශිෂ්‍යයා සමග පාසලට යයි.

भिक्षुः दायकैः सार्धं संलपति।
භික්ෂුව දායකයන් සමග පිළිසඳරේ යෙදෙයි.

## වරනැඟීම

### 11.1 ක්‍රියාකාරකම

ඍකාරාන්ත පුල්ලිංග **पितृ** ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | पिता | पितरौ | पितरः |
| | පියා | පියවරු දෙදෙන | පියවරු |
| सम्बोधन | हे पितः | हे पितरौ | हे पितरः |
| | පින්වත් පියතුමනි | පින්වත් පියවරු දෙදෙනනි | පින්වත් පියවරුනි |
| द्वितीया | पितरम् | पितरौ | पितॄन् |
| | පියා | පියවරුන් දෙදෙන | පියවරුන් |
| तृतीया | पित्रा | पितृभ्याम् | पितृभिः |
| | පියා විසින් | පියවරුන් දෙදෙනා විසින් | පියවරුන් විසින් |
| चतुर्थी | पित्रे | पितृभ्याम् | पितृभ्यः |
| | පියාට | පියවරුන් දෙදෙනාට | පියවරුන්ට |
| पञ्चमी | पितुः | पितृभ्याम् | पितृभ्यः |
| | පියාගෙන් | පියවරුන් දෙදෙනාගෙන් | පියවරුන්ගෙන් |
| षष्ठी | पितुः | पित्रोः | पितॄणाम् |
| | පියාගේ | පියවරුන් දෙදෙනාගේ | පියවරුන්ගේ |
| सप्तमी | पितरि | पित्रोः | पितृषु |
| | පියා කෙරෙහි | පියවරුන් දෙදෙනා කෙරෙහි | පියවරුන් කෙරෙහි |

## 11.2 ක්‍රියාකාරකම

පුල්ලිංග **पितृ** ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද පාඩම් කර වරනගමු.

| | | | | |
|---|---|---|---|---|
| जामातृ | - | බෑනා | भ्रातृ | - සොහොයුරා |
| देवृ | - | මස්සිනා | नृ | - මිනිසා |

### අවධානයට

පහත දැක්වෙන ශබ්ද ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා විභක්තිවල පමණක් තරමක් වෙනස් ව වරනැගේ.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | गन्ता | गन्तारौ | गन्तारः |
| सम्बोधन | हे गन्तः | हे गन्तारौ | हे गन्तारः |
| द्वितीया | गन्तारम् | गन्तारौ | गन्तॄन् |

සෙසු විභක්තිවල **पितृ** ශබ්දයට සමාන ව වරනැගේ

| | | |
|---|---|---|
| शास्तृ - ශාස්තෘවරයා | विधातृ - බ්‍රහ්මයා | सवितृ - හිරු |
| नप्तृ - මුණුබුරා | कर्तृ - කරන්නා | दातृ - දෙන්නා |
| भर्तृ - සැමියා | जेतृ - දිනන්නා | नेतृ - නායකයා |
| स्थातृ - සිටින්නා | पातृ - රකින්නා | छेत्तृ - කපන්නා |
| पोतृ - පවිත්‍රකරන්නා | रक्षितृ - ආරක්ෂකයා | दोग्धृ - කිරිදොවින්නා |
| वक्तृ - කියන්නා | श्रोतृ - අසන්නා | द्रष्टृ - බලන්නා |



## 11.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.

१ कर्षकः खनित्रेण खनति ।

२ शिशवः कन्दुकेन क्रीडन्ति ।

३ अनुजः चषकेन उदकं पिबति ।

४ धनिकाः गगनयानेन देशान्तरं गच्छन्ति ।

५ नाविकाः पोतेन सिन्धुं तरन्ति ।

६ अहं नेत्राभ्यां चित्रं पश्यामि ।

७ उपासकाः पुष्पेभ्यः बुद्धं पूजयन्ति ।

८ पिता पुत्रेण सह देवालयं गच्छति ।

९ हे विनीत, गुरुणा सार्धं विहारं गच्छ ।

१० भ्राता पित्रा सार्धं द्विचक्रेण आपणं गच्छति ।

## 11.2 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.**

1. උපසකයා අතින් පහන ගෙන එයි.
2. සැමියා පොරොවෙන් දර පළයි.
3. මම ගුරුවරයා සමග විශ්වවිද්‍යාලයට යමි.
4. පුත්තු දෙදෙන රථ දෙකෙන් ගෙදර එති.
5. මච්චරු කළවලින් ජලය ගෙන එති.
6. අපි මිතුරන් සමග පාසලට යමු.
7. නායකයා අනුශාසකයන් සමග ගුවන්යානයෙන් පිටරට යයි.
8. පින්වත් දරුව, දුර්ජනයන් සමග සෙල්ලම් නොකරන්න.
9. ජනාධිපතිතුමා ඇමතිවරුන් සමග විහාරයට පිවිසෙයි.
10. සීයා මුණුබුරා සමග පාපැදියෙන් නගරයට යයි.

### භාවිතයට

**श्रोत्रं श्रुतेनैव न कुण्डलेन ।**
**दानेन पाणिर्न तु कङ्कणेन ॥**
**विभाति कायः खलु सज्जनानां ।**
**परोपकारेण न चन्दनेन ॥**

කන කුණ්ඩලාභරණයෙන් නොව (යහපත් දේ) ඇසීමෙන් ම බබළයි; අත රන් වළල්ලෙන් නොව පරිත්‍යාගයෙන් බබළයි; සත්පුරුෂයන්ගේ ශරීරය සඳුන් ආලේපයෙන් නොව පරෝපකාරයෙන් ම බබළයි.


නොමිලේ බෙදහැරීම සඳහා ය.